*The Journal of Desk Research Review and Analysis, Vol. 1, Issue 1, 2023, 45-52.*

# A STUDY ON PUNYA LEKHANA TRADITION IN SRI LANKA: WITH REFERENCE TO KANDYAN ERA

Hasitha Chamikara Gunasinghe[1]

**Abstract**

From the ruler to the ordinary citizens, the documents that record the meritorious deeds can be called 'Punya Lekhana'. The history of writing these documents can be traced back to time immemorial. The primary influence of these writings was the belief in meritorious acts of man, and the ideas and ideologies on good deeds and as shaped up by tradition. The aim of this research was to study the charity writing tradition in Sri Lanka and the research question was whether this tradition continued during the Kandyan Period. Historical methodology was applied for this research. It seems that the idea of keeping a record of the merits done by oneself started at the beginning of the Kandyan era, and 'Punya Lekhana' was compiled to record the merits done by the king and the ordinary people. It was a custom to prepare and keep the most common pious writings written in a temple using palm leaf medium as an appendix to a palm leaf manuscript or as a palm leaf manuscript. Since there are charitable documents of various natures, classification is possible according to their nature. These are Punyanumodhana Patra, Pundyanumodhana Sandesa, Punya Pustaka and Punya Ayadeum Patra. It is evident that these charity writings can be useful to genealogists to obtain information on genealogy. Howerver it can be said that these documents were not been used as primary sources in historical research. This study underlines the fact that these are a unique source of literature in studying the religious, political and socio-economic history of the kandian Period.

***Keywords:*** Punya Lekhana, Kandian Period, Palm Leaf Manuscirpts, History of Buddhism

---

[1] Lecturer, Department of History, University of Kelaniya

Email: hasithac@kln.ac.lk https://orcid.org/0009-0005-6838-6696

Accepted the revised version: 09 November 2023
This work is licensed under CC BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

*The Journal of Desk Research Review and Analysis, Vol. 1, Issue 1, 2023, 45-52.*

# ලක්දිව පුණ්‍ය ලේඛන සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනයක්: මහනුවර යුගය ඇසුරෙන්

හසිත චාමිකර ගුණසිංහ

**සාරසංක්ෂේපය**

පාලකයාගේ පටන් සාමාන්‍ය ජනතාව දක්වා සිදු කළ පින්කම් සටහන් කර ඇති ලේඛන විශේෂය 'පුණ්‍ය ලේඛන' (පුඤ්ඤ ලේඛන) නමින් හැඳින්විය හැකිය. ඒ සඳහා අනාදිමත් කාලයක පටන් පසුබිම සැකසී තිබූ අතර මහනුවර යුගයට අදාළව මෙවැනි ලේඛන රාශියක් හඳුනාගත හැකිය. මෙකී ලේඛන සම්පාදනයට ප්‍රධාන බලපෑම කරන ලද්දේ මිනිසා තුළ පැවති පින් පව් පිළිබඳ විශ්වාසයයි, නොඑසේ නම් යහපත් ක්‍රියා, අයහපත් ක්‍රියා පිළිබඳ පැවති අදහස් සහ මතවාදයි. ලක්දිව පුණ්‍ය ලේඛන සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කරගත් මෙම අධ්‍යයනයේදී අධ්‍යයන ගැටලුව බවට පත්වූයේ මහනුවර යුගයේ පුණ්‍ය ලේඛන සම්ප්‍රදාය පැවති අන්දම කෙබඳු වී ද යන්න සොයාබැලීමයි. එහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් යොදාගැනුණේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි. තමන් විසින් සිදු කරන ලද පින්කම් ලේඛනගත කොට තැබීමේ අදහස මහනුවර යුගය ආරම්භයේ පටන් පැවති අතර රජතුමාගේ පටන් සාමාන්‍ය ජනතාව දක්වා තමන් විසින් සිදු කරන ලද පින්කම් සටහන් කර තැබීමට 'පුණ්‍ය ලේඛන' සම්පාදනය කළ බව පෙනේ. බහුලවම පුස්කොළ මාධ්‍යය කොටගෙන රචිත පුණ්‍ය ලේඛන බොහෝ විට පුස්කොළ පොතක ඇමුණුමක් ලෙස හෝ පුස්කොළ පොතක් වශයෙන් හෝ සකස් කොට විහාරස්ථානයක තැන්පත් කර තැබීමේ සිරිතක් වූ බව දැකගත හැකිය. විවිධ ස්වභාවයන්ගෙන් යුතු පුණ්‍ය ලේඛන පවතින හෙයින් ඒවායේ ස්වභාවය අනුව වර්ගීකරණය කිරීමේ හැකියාව පවතී. ඒ පුණ්‍යානුමෝදනා පත්‍ර, පුණ්‍ය පුස්තක, පුණ්‍යානුමෝදනා සන්දේශ, පුණ්‍ය අයැදුම් පත්‍ර යනුවෙනි. වංසකථාකරුවාට වංසකථාකරණයේදී තොරතුරු ලබාගන්නට උපකාරී වූ බව පිළිගත හැකි පුණ්‍ය ලේඛන මහනුවර යුගයේ ආගමික අංශය පිළිබඳ පමණක් නොව දේශපාලන, සමාජ හා ආර්ථික තොරතුරු පිළිබඳව ද කරුණු ලබාගත හැකි, මෙතෙක් අවධානය යොමු නොවූ සාහිත්‍ය මූලාශ්‍රය විශේෂයක් ලෙස හඳුන්වාදීමට හැකිය.

**ප්‍රමුඛ පද :** *පුණ්‍ය ලේඛන, මහනුවර යුගය, පුස්කොළ පොත්, බුදුසමයේ ඉතිහාසය*

## හැඳින්වීම

පාලකයාගේ සිට සාමාන්‍ය ජනතාව දක්වා තමන් විසින් සිදු කරන ලද පින්කම් සටහන් කර තැබීමට සම්පාදිත ලේඛන 'පුණ්‍ය ලේඛන' (පුඤ්ඤ ලේඛන) යනුවෙන් හැඳින්විය හැකිය. සිත පිවිතුරු කරන කුසල ධර්ම, සසර සැප ගෙන දෙන ක්‍රියා, සිත පවිත්‍ර කරන ක්‍රියා, යහපත් හෝ පිරිසිදු සිතින් කරන ක්‍රියා, පින යනුවෙන් ශබ්දකෝෂවල අර්ථ ගන්වා තිබේ (*ශ්‍රී සුමංගල ශබ්දකෝෂය* - ද්විතීය භාගය, 2011, පි. 621; *පාඨශාලීය සද්ධර්ම කෝෂය*, 2002, පි. 170; *බෞද්ධ ශබ්දකෝෂය* II, 2010, පි. 1009, 992). මේ අනුව එවැනි දෑ සටහන් කර තිබෙන ලේඛන, පුණ්‍ය ලේඛන වශයෙන් පෙන්වා දිය හැකිය.

මහනුවර යුගයට අදාළව මෙවන් ලේඛන රාශියක් හමුවුව ද, ඒ සඳහා අනාදිමත් කාලයක පටන් ඊට පසුබිම සැකසී තිබූ බව පෙනේ. පුණ්‍ය ලේඛන රචනාවීම සඳහා මූලික බලපෑම සිදු කරන ලද්දේ මිනිසා තුළ පැවති පින් පව් පිළිබඳ විශ්වාසයයි. නොඑසේ නම් යහපත් ක්‍රියා, අයහපත් ක්‍රියා පිළිබඳ පැවති අදහස් සහ මතවාදයි.

ලක්දිව පුණ්‍ය ලේඛන සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කරගත් මෙම අධ්‍යයනයේදී අධ්‍යයන ගැටලුව බවට පත්වූයේ මහනුවර යුගයේ පුණ්‍ය ලේඛන සම්ප්‍රදාය පැවති අන්දම කෙබඳු වී ද යන්න සොයාබැලීමයි. එහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් යොදාගැනුණේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි.

## ලක්දිව පුණ්‍ය ලේඛන සම්ප්‍රදායේ ආරම්භය

ලක්දිව පුණ්‍ය ලේඛන සම්ප්‍රදාය ආරම්භ වන්නේ ක්‍රි.පූ. තුන්වන සියවසේ සිදු වූ මහින්දාගමනයෙන් අනතුරුව ය. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරට මැනවින් බුදුසසුන ප්‍රතිෂ්ඨාපනය වූ අතර ආරම්භයේදීම ලක්වැසියන් හට පින් සහ පව් පිළිබඳ අවබෝධයක් ලබාදීමට මිහිඳු මහරහතන් වහන්සේ විසින් කටයුතු කරන ලදී. ඒ ලක්දිවට වැඩම කොට දෙවන දිනයේ රජමාලිගයට වැඩමකොට දේවානම්පියතිස්ස රජතුමා (ක්‍රි.පූ. 250-210) ප්‍රධාන පිරිසට පළමුව *පේතවත්ථුව* ද, දෙවනුව *විමානවත්ථුව* ද දේශනා කිරීමෙනි. *පේතවත්ථුවෙන්* ජනයා සංවේගයට පත් කළ උන්වහන්සේ අනතුරුව *විමානවත්ථුවෙන්* ඔවුන් අස්වැසීම සිදු කළ බව *වංසත්ථප්පකාසිනියේ* සඳහන් වේ (*ඌනපූරණ සහිතො මහාවංසො*, 2006, 14:58 ගාථාව; *වංසත්ථප්පකාසිනී*, 2001, පි. 257).

ඒ හේතුවෙන් ලක්දිව බුදුසසුන පිහිට වූ සමයේ පටන්ම පින් සිදුකොට ඒ පිළිබඳ නැවත නැවතත් සිතා සතුටුවීම, පින් අනුමෝදන් කිරීම හා පින් අනුමෝදන් වීම වැනි දෑ පිළිබඳ ලාංකික බෞද්ධයන් අවබෝධයෙන් සිටි බව

පැහැදිලි වේ. ඒවා ලේඛනගතකොට තැබීම අනුරාධපුර මුල් යුගයේ පටන් සිදු වූ බවට හොඳම නිදසුන වන්නේ මරණ මංචකයේ සිටි දුටුගැමුණු රජතුමා (ක්‍රි.පූ. 161-137) තමාගේ පින්පොත කියවීම සඳහා ලියන්නා මෙහෙයවීමට කටයුතු කළ බව දැක්වෙන *මහාවංස* සඳහනයි (*ඌනපූරණ සහිතො මහාවංසො*, 32:25 ගාථාව). රජතුමා විසින් සිදු කරන ලද පින්කම් සවිස්තරාත්මකව ලේඛනගත කොට තැබීම සඳහා 'පින්පොත' (පුඤ්ඤපොත්ථක) නමින් ලේඛනයක් එකල පැවති බවත්, එහි ලේඛන කාර්යය සඳහා 'ලේඛකයකු' (ලේඛකං) නිල වශයෙන් පත්කර තිබූ බවත් මින් පැහැදිලි වේ. එම සම්ප්‍රදාය රජතුමාගේ සිට මහජනතාව දක්වා අඛණ්ඩව මහනුවර යුගය දක්වාම පැවති බවට සාධක හඳුනාගත හැකිය.

**මහනුවර යුගයේ පුණ්‍ය ලේඛන සම්ප්‍රදාය**

වර්තමානය දක්වා සුරක්ෂිතව පවතින පුස්කොළ ලේඛන බොහොමයක් අයත් වන්නේ මහනුවර යුගයට ය. ඉන් වැඩි ප්‍රමාණයක් ධර්ම ග්‍රන්ථ හෝ බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ වේ. ඒ අතර දැකගත හැකි සුවිශේෂී ලේඛන විශේෂයක් වශයෙන් පුණ්‍ය ලේඛන හඳුනාගත හැකිය. මහනුවර යුගයේදී ඒවා සම්පාදනය කිරීම සඳහා මූලික පසුබිම මහනුවර රාජධානියක් වශයෙන් පළමුවරට ස්ථාපනය වූ සේනාසම්මත වික්‍රමබාහු රජ දවස (1469-1511) පටන් පැවති බව පෙනේ. *අස්ගිරි තල්පත* නම් සමකාලීන මූලාශ්‍රයේ ඒ කාලසීමාවට අදාළ පුණ්‍ය ලේඛනයක් පිළිබඳ සාධක හඳුනාගත හැකිය. එහි සඳහන් වන අන්දමට අස්ගිරි ගණනායක පදවිය ඉසිලූ මාවතගම සෝණුත්තර හිමියන් අපවත්වීමෙන් පසුව මරළුවාවේ සේනගුත්ත නම් හිමියන් අස්ගිරි විහාරය පිළිබඳ සෙංකඩගල සේනාසම්මත වික්‍රමබාහු රජතුමාට දන්වා විහාරයේ සුන්බුන් හරවා 'පින් ඔප්පු කළ අවස්ථාවේදී' උන්වහන්සේට අස්ගිරි ගණනායක පදවිය හිමිව තිබේ (*අස්ගිරි තල්පත*, 1997, පි. 10). මෙම පුවතින් රජතුමාට පින් අනුමෝදන් කිරීමක් සිදු කරන ලද බවට කරුණු හෙළිවන අතර එකී කාර්යය සඳහා බොහෝ විට පින් ලේඛනගත කළ ලියවිල්ලක් නොඑසේ නම් පුණ්‍ය ලේඛනයක් භාවිත වන්නට ඇතැයි පිළිගත හැකිය.

මින් අනතුරුව විහාරස්ථාන හා සම්බන්ධ සන්නස්, තුඩපත් රූසකම එකී විහාර පිළිසකර කරවා රජතුමාට පින් ඔප්පු කළ අවස්ථාවේ හෝ ඊට පෙර ප්‍රතිසංස්කරණ කටයුතු උදෙසා රජතුමා විසින් ගම්වර පුදනු ලැබූ බව තොරතුරු හමු වේ. ඊට උදාහරණ කීපයක් පහතින් දක්වා තිබේ.

බෝගන්දන විහාර සන්නසේ එහි වරින් වර කළ ප්‍රතිසංස්කරණ පිළිබඳ දක්වා ඇති අතර පළමුවරට මෙම විහාරයේ කටයුතු පිළිබඳ සෙනරත් රජතුමාට (1604-1635) සැල කළ අවස්ථාවේ රජතුමා විසින් මතු බුද්ධත්වය ප්‍රාර්ථනා කරමින් ගම්වරයක් පූජා කරනු ලැබ තිබේ. පසුව දෙවන රාජසිංහ රජ දවස (1635-1687) විහාරයේ පින්කම් කරවා රජතුමාට පින් අනුමෝදන් කළ අවස්ථාවේ රජතුමා විසින් ද ගම්වරයක් පූජා කරන ලදැයි එහි වැඩිදුරටත් සඳහන් වේ (ධම්මානන්ද හිමි, 1966, පි. 228-233). කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ (1747-1781) බොහෝ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය සිදු වූ හෙයින් සන්නස් හා තුඩපත් රූසක රජතුමා විසින් විහාරස්ථාන සඳහා කළ අනුග්‍රහ පිළිබඳ තොරතුරු දක්වා තිබේ. කොණ්ඩදෙණියේ සන්නස, බඹරගල තඹ සන්නස, වලල විහාර තුඩපත ඊට නිදසුන් කිහිපයකි (ධම්මානන්ද හිමි, 1969, පි. 198-204). රාජාධි රාජසිංහ සමයට (1781-1798) අයත් ගලගම ගල් විහාර සන්නසේ සඳහන් වන අන්දමට මහඅරමුදලේ දායකත්වයෙන් විහාරයේ ජරාවාස හරවා නේත්‍රා මංගල්‍යය කොට රජතුමාට පින් අනුමෝදන් කළ අවස්ථාවේ පින් අනුමෝදන් වෙමින් රජතුමා විසින් විහාරයට ගම්බිම් පූජා කරනු ලැබ තිබේ (ධම්මානන්ද හිමි, 1969, පි. 232-236). ශ්‍රී වික්‍රම රාජසිංහ රජ දවස ද (1798-1815) මෙම සිරිත එයාකාරයෙන්ම පැවති බව සැලව විහාර සෙල්ලිපියෙන් පෙනේ. එහි සඳහන් වන අන්දමට මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන් විසින් ජරාවාසව තිබූ සැලව විහාරය පිළිසකර කරවා රජතුමාට එය ඔප්පු කරන ලද අවස්ථාවේ විහාරයේ පුදසිරිත් අඛණ්ඩව පැවැත්වීමට සහ භික්ෂූන්ගේ ප්‍රත්‍ය පිණිස රජතුමා විසින් සැලව ගම පූජා කරන ලද බව සැලව සෙල්ලිපියේ සඳහන් වේ. මීට අමතරව කොට්ටඉඹුල්වල විහාර තඹ සන්නස හා දියඉන්නේ ගනේලන්ද විහාර පුස්කොළ සන්නස ආදිය ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට පින් අනුමෝදන් කළ බව දැක්වෙන උදාහරණ කිහිපයකි (ධම්මානන්ද හිමි, 1969, පි. 157-158, 181-183, 266-267).

පින් අනුමෝදන් කිරීමට අතිරේකව පින්කම් ග්‍රන්ථයක් වශයෙන් ලේඛනගත කොට තැබීමේ අදහස ද මහනුවර යුගයේ ආරම්භයේ පටන් පැවති බව පෙනේ. ඒ පිළිබඳ දහසයවන සියවස මැදභාගයේ පමණ වල්ගම්පාය අභයරාජ පිරිවෙන්වාසී හිමිනමක විසින් රචිත *රාජරත්නාකරය* නම් ග්‍රන්ථයෙන් ඉඟි කරයි. ග්‍රන්ථය රචනා වූ අවධියේ උඩරට පාලකයාව සිටියේ වීර වික්‍රම නම් රජතුමා බව *මහාවංසය* දක්වයි (*ඌනපූරණ සහිතො මහාවංසො*, 2006, 90:06-09 ගාථාව). එකී රජතුමා විසින් සිදු කරන ලද අනේකවිධ පින්කම් රාශියක් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු *රාජරත්නාකරයේ* අවසානයට අන්තර්ගත වේ. ඒ අතර වෙහෙර විහාර ඉදිකරවීම හා පිළිසකර කරවීම, ධර්ම ග්‍රන්ථ ලියවීම, භික්ෂූන්ට මහදන් පැවැත්වීම, ශ්‍රී පාදය වන්දනා කිරීම සහ එහි යන වන්දනාකරුන්ට පහසුව සැලසීම ආදිය වේ (*රාජරත්නාකරය*, 1995, පි. 134-151). මෙම විස්තරය අනුව උපකල්පනය කළ හැක්කේ රජතුමාගේ පින්පොතක් හෝ පුණ්‍ය ලේඛන එකී සාහිත්‍ය කාර්යය සඳහා යොදා ගැනෙන්නට ඇති බවයි.

සමකාලීන මහනුවර සමාජයේ තුළ පින්කම් පිළිබඳ සහ පුණ්‍යානිශංස පිළිබඳ තිබූ උනන්දුව තවත් ඉහළ නංවනු වස් *පාලි විමානවත්ථු* ග්‍රන්ථය, *සිංහල විමානවත්ථු ප්‍රකරණය* නමින් සිංහලයට පරිවර්තනය වීම ද විශේෂ සිදුවීමකි. කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස මල්වතු මහාවිහාරවාසී ගම්මුල්ලේ රතනපාල හිමියන් විසින් එකී කාර්යය සිදු කරන ලද අතර උන්වහන්සේගේ අරමුණ වී ඇත්තේ පන්සිල් රැකීම, යහපත් ධාර්මික හැසිරීම ආදී කාර්යය නිසා දිව්‍ය සම්පත් ලබාගත හැකි ආකාරය සිංහල බසින් ජනතාවට අවබෝධ කරවීමයි (*සිංහල විමාන වස්තු ප්‍රකරණය*, 2003, පි. 7-8). එපමණක් නොව දඹදෙණි යුගයේදී දසපුණ්‍ය ක්‍රියා, පුණ්‍යඵල සාධනය ආදී තොරතුරු ඇතුළත් කොට රචිත *උපාසක ජනාලංකාරය* නම් පාලි ග්‍රන්ථය සිංහලයට පරිවර්තනය කිරීම සිදුවූයේ ද මෙම අවධියේම ය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජ දවස එකී කාර්යය සිදු කරන ලද්දේ මල්වතු මහනායක මොරතොට ශ්‍රී ධම්මක්ඛන්ධ මහනාහිමියන් විසිනි. එහි අරමුණ වශයෙන් උන්වහන්සේ විසින් දක්වනු ලබන්නේ උපාසක උපාසිකාවන්ට සුව සේ අසා බලා එහි කියැවෙන ගුණ වටහා ගැනීමට සිංහල භාෂාවෙන් අර්ථය දක්වන බවයි (*සිංහල උපාසක ජනාලංකාරය*, 1961, පි. XI, XIX-XXI). සියම් උපසම්පදාවෙන් නැවත වරක් ශාසන දියුණුවක් ඇතිවී තිබුණ ද, උපාසක උපාසිකාවන්ට ධර්මාවබෝධය ලබාදෙමින් පුණ්‍ය ක්‍රියාවේ යෙදවීමට මෙවැනි ග්‍රන්ථ මනා පිටුබලයක් වන්නට ඇත.

ඒ සමගම මහනුවර යුගයේ රචනා කෙරුණු බව සැලකෙන *කෝසල බිම්බ වර්ණනාව* නම් කෘතියෙන් ද විවිධාකාරයේ පුණ්‍ය ක්‍රියා සිදුකිරීම සඳහා ලබා දී තිබුණේ නොමඳ බලපෑමකි. බුදුන් ජීවමාන දවස කොසොල් රජතුමා විසින් බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීමේ පුවත අන්තර්ගත මෙම කෘතියේ බුදු පිළිම නිර්මාණයේ සහ ධර්ම ග්‍රන්ථ රචනා කිරීමේ ආනිශංස රැසක් දක්වා තිබිණි. එසේම 'ධර්ම ග්‍රන්ථයක අක්ෂරයක් බුදු පිළිමයක් හා සමාන වේ' යන අදහස එමගින් ලබා දී තිබූ අතර ඒ නිසා බොහෝ බෞද්ධයන් බුදු පිළිම නිර්මාණය හා ධර්ම ග්‍රන්ථ රචනාකරණයට අමතරව තවත් පින්කම් සිදු කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය (*කෝසල බිම්බ වර්ණනාව*, 2015, පි. 15-25).

එවන් පසුබිමක් තුළ රජතුමාගේ සිට සාමාන්‍ය ජනතාව දක්වා තමන් විසින් සිදු කරන ලද පින්කම් සටහන් කර තිබෙන 'පුණ්‍ය ලේඛන' නමින් හැඳින්විය හැකි ලේඛන සම්පාදනය වූ බව පෙනේ. මේ පිළිබඳ අදහස් දක්වන මහාචාර්ය මංගල ඉලංගසිංහ දක්වන්නේ කන්ද උඩරට රාජධානි සමයේ පින් වට්ටෝරු (පුණ්‍ය ලේඛන) ජනප්‍රිය ලේඛන විශේෂයක් වූ බවත්, ඉන් වංසකථාකරුවාට ආගමික කටයුතු පිළිබඳ තොරතුරු ලබාගැනීමේදී අතිශය ප්‍රයෝජනවත් වන්නට ඇති බවයි (ඉලංගසිංහ, 2005, පි. 5). එහෙත් ආගමික කටයුතු පිළිබඳ පමණක් නොව දේශපාලන හා සමාජ තොරතුරු ද අන්තර්ගත මෙම පුණ්‍ය ලේඛන විවිධ ප්‍රමාණයන්ගෙන් හා විවිධ ස්වරූපයෙන් රචනා කොට තිබෙන බව හඳුනාගත හැකිය.

පුණ්‍ය ලේඛන සම්ප්‍රදායේදී ලේඛන මාධ්‍ය වශයෙන් පුස්කොළ යොදාගැනුණු අතර විටෙක වෙනත් මාධ්‍ය ඒ සඳහා භාවිත කළ බව පෙනේ. දළදා වහන්සේ උදෙසා ඇහැලේපොළ මහාදිකාරම් විසින් පූජා කරන ලද දළදා කරඬුවේ පාදම වටා කොටවා ඇති ඇහැලේපොළ මහාදිකාරම්ගේ පුණ්‍ය සටහන ඊට නිදසුනකි (සෙනෙවිරත්න, 2003, පි. 178). පුස්කොළවල ලියූ පුණ්‍ය ලේඛන බොහෝ විට පුස්කොළ පොතකට ඇමුණුමක් ලෙස හෝ පුස්කොළ පොතක් වශයෙන් සකස් කොට විහාරස්ථානයක තැන්පත් කර තැබීමක් සිරිතක් වූ බව සිතිය හැකිය. අනෙක් අතට එමගින් සිදු කර තිබෙන පූජාවේ නෛතික බලය ද එකී ලේඛනයෙන් පිළිබිඹු කෙරෙන හෙයින් නෛතික ලියවිල්ලක තත්ත්වය පුණ්‍ය ලේඛනයට හිමිවන්නට ඇත. ඉහතින් සඳහන් කළ අන්දමට විවිධ ප්‍රමාණයන්ගෙන් මෙන්ම විවිධ ස්වරූපයෙන් පුණ්‍ය ලේඛන පවතින හෙයින් ඒවායේ ස්වභාවය අනුව වර්ගීකරණය කිරීමේ හැකියාව පවතී.

**මහනුවර යුගයේ පැවති පුණ්‍ය ලේඛන වර්ගීකරණය**

අධ්‍යයනයේ පහසුව තකා සහ පුණ්‍ය ලේඛනවල අන්තර්ගතය මෙන්ම ස්වරූපය අනුව පහත අන්දමට මහනුවර යුගයේ පුණ්‍ය ලේඛන වර්ගීකරණය සිදුකිරීමට පුළුවන;

- පුණ්‍යානුමෝදනා පත්‍ර
- පුණ්‍ය පුස්තක
- පුණ්‍යානුමෝදනා සන්දේශ
- පුණ්‍ය අයැදුම් පත්‍ර

**පුණ්‍යානුමෝදනා පත්‍ර**

පුණ්‍යානුමෝදනා පත්‍ර යනුවෙන් හැඳින්වෙන්නේ පින්කම් එකක් හෝ කිහිපයක් විස්තර කොට සංක්ෂිප්තව රචනා කරන ලද පුණ්‍ය ලේඛන ය. තමන් විසින් සිදු කරන ලද පින්කම් තමාටම අනුමෝදන් කරගැනීම හෝ රජතුමා ප්‍රධාන නිලධාරීන්ට අනුමෝදන් කිරීමත්, අවසානයට කිසියම් ලෞකික හෝ ලෝකෝත්තර ප්‍රාර්ථනාවක් සිදු කර තිබීමත් මෙහිදී දැකගත හැකිය. ගද්‍ය මෙන්ම පද්‍ය මාධ්‍යයෙන් පුණ්‍යානුමෝදනා පත්‍ර රචනා කර තිබීම

විශේෂත්වයකි. රජතුමාට හෝ රදල ප්‍රධානියකුට තමන් විසින් සිදු කරන ලද පින්කම් අනුමෝදන් කිරීමට හේතුවන්නට ඇත්තේ රජතුමාගේ හෝ රදල ප්‍රධානියාගේ ප්‍රසාදය ලබාගැනීමේ අරමුණින් විය යුතු ය.
අනෙක් අතට තමන්ගේ පූජාව සඳහා පාලනාධිකාරියේ අනුමැතිය ලබාගැනීම මෙහි වක්‍ර අරමුණක් වන්නට ඇත. 'ලංකාද්වීපයේම අයිතිය රජතුමා සතු ය' යන සංකල්පයක් පැවති හෙයින් විහාරයකට වුව ද ඉඩමක් හෝ ගම්බිම් පූජා කරන්නේ නම් ඒ බව රජතුමාට දැනුම්වත් කිරීමට ද පුණ්‍යානුමෝදනා පත්‍රය උපයෝගී වූ බව පෙනේ. ඒ හැරුණුවිට තමන්ගේ ඉදිරියට පින්කම්වලට ද කිසියම් අනුග්‍රහයක් ලබාගැනීමට පුණ්‍යානුමෝදනා පත්‍ර පාදක වී තිබේ.

මෙම කාලසීමාවට අදාළව පොදු ජනතාව මෙන්ම රදල ප්‍රධානීන් හා භික්ෂූන් රචිත පුණ්‍යානුමෝදනා පත්‍ර ද හඳුනාගත හැකිය. සාමාන්‍ය වැසියන් විසින් රචිත පුණ්‍යානුමෝදනා පත්‍ර කිහිපයකට නිදසුන් පහතින් දැක්වේ. සබරගමුවේ පොත්ගුල් විහාරයෙන් හමුවන වීරහින්නේ ලොකුඅප්පු නම් තැනැත්තා විසින් පොත්ගුල් විහාරයට ඉඩම් පූජාකොට තමන්ට ද පින් ප්‍රාර්ථනා කොට ලේඛනයේ අවසානයට දක්වා ඇත්තේ,

> ... මෙහි කුසල් ශ්‍රීමත් ලන්කාධිපති වූ උතුම් මහවාසල හාමුදුරුවන්ට අයිති වේවා. මේ ඇර දිසාව ලත් මහනිලමේ හාමුදුරුවන්ට හා රට මැද සියළු නිලම කරණ පැමිණි තැන්වලට ද අයිති වේවා....

යනුවෙනි (ඥාණවිමල හිමි, 1967, පි. 147-148).
රදල ප්‍රධානීන් ද තමාට මෙන්ම රජතුමාට පින් අනුමෝදන් කරමින් පුණ්‍යානුමෝදනා පත්‍ර රචනා කර තිබෙන අතර කිතලබොක්ක විහාරයෙන් හමුවන පුණ්‍ය ලේඛනයක පහත විස්තර දැක්වේ. මහඅරමුදලේ වන්නකු නිලමේ, සළුවඩන නිලමේ සහ සබරගමු දිසාව තනතුරු දැරූ පිළිමතලව්වේ නිලමේ විසින් රචිත එම ලේඛනයේ,

> ...ශ්‍රී ලඞ්කේශ්වර වූ උතුම් මහවාසලට ලොවුතුරා බුද්ධත්වය සිද්ධවෙන පිණිසත් අපට පිං සිද්ධ වෙන පිණිසත් ලෝලුවල කුඹුර දන ආහාරයට සාංඝික වශයෙන් කිතලබොක්කේ විහාර වහන්සේට පූජා කළ බවට....

යනුවෙන් පුණ්‍යානුමෝදනා කර තිබේ (ඥාණවිමල හිමි, 1967, පි. 317).
භික්ෂූන් විසින් ද පුණ්‍යානුමෝදනා පත්‍ර රචනා කර තිබෙන අතර රජතුමාට මෙන්ම ආචාර්යවරුන්ට ද පින් අනුමෝදන් කිරීමට ඒවා උපයෝගී කොටගෙන ඇති බව පෙනේ. දික්වැල්ලේ බුද්ධරක්ඛිත නම් හිමියන්ගේ පුණ්‍යානුමෝදනා පත්‍රයෙන් උන්වහන්සේ ආචාර්යවරයා යැයි සිතිය හැකි අත්පනාගල නම් භික්ෂූන් වහන්සේට ලොවුතුරු බුද්ධත්වය ප්‍රාර්ථනා කොට තිබේ (වීරසූරිය, 2006, පි. 256-257).

විටෙක රාජසභාවේ ඉහළ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ පුණ්‍ය ලේඛන සටහන් කොට තැබීමට ද භික්ෂූන් පෙළඹුණු බව පෙනේ. වරෙක ඇහැලේපොළ මහාදිකාරම්තුමා විසින් අංගම්මන විහාරයේ කරවන ලද විහාර කර්මාන්තයේ විස්තර හා එහි පින් උත්පලවර්ණ, සුමන සමන් ආදී දෙවිවරුන්ට අනුමෝදන් කරමින් අක්මීමන සිරිධම්ම හිමියන් විසින් රචනා කරන ලද පාලි පද්‍යාවලිය මීට නිදසුන් වශයෙන් දැක්විය හැකිය. එකී දෙවිවරුන් විසින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයත්, ඇහැලේපොළ මහාදිකාරම්තුමාත් ආරක්ෂා කෙරේවා යන්න උන්වහන්සේ අවසානයට ප්‍රාර්ථනා කරති. මෙම පාලි පද්‍යාවලිය කියවීමෙන් සතුටට පත් රජතුමා විසින් අක්මීමන සිරිධම්ම හිමියන්ට සබරගමුවේ රණබාහුගම පූජා කළ බව කියැවේ (ධම්මානන්ද හිමි, 1969, පි. 127-133).

තවත් අවස්ථාවක කරතොට ධම්මාරාම නාහිමියන් ලවා පිරිත් පොතක් සම්පාදනය කරවාගත් ලෙවුකේ දිසාව විසින් මහා පින්කමකින් අනතුරුව එම ග්‍රන්ථය මහාසංඝයාට පූජා කිරීමට කටයුතු කර තිබේ. සත්දිනක් ධර්ම දේශනා පවත්වා ඉන් අනතුරුව මහදන් සිදුකොට අවසානයේදී ලෙවුකේ දිසාවේ විසින් බුදු බව ප්‍රාර්ථනා කරමින් දනගිරිගල විහාරස්ථානය මෙම පිරිත් පොත පූජා කරන ලදැයි කරතොට නාහිමියන් විසින් එකී ග්‍රන්ථාවසානයට එක්කර ඇති ගාථාවලින් පෙනේ (ගමගේ, 1980, පි. 95-97).

**පුණ්‍ය පුස්තක**
තමන් විසින් සිදු කරන ලද පින්කම් සවිස්තරාත්මකව සහ දීර්ඝව සඳහන් කර ඇති පුණ්‍ය ලේඛන, පුණ්‍ය පුස්තක (පින්පොත්) වශයෙන් හඳුනාගත හැකිය. එය තමන් විසින් හෝ තමන් වෙනුවෙන් අනුන් ලවා රචනා කරවනු ලැබේ. විටෙක අදාළ දින වකවානු ද මේවායේ අන්තර්ගතව තිබීම විශේෂ ය. හරංකහවේ බුද්ධරක්ඛිත නම් හිමියන් විසින් රචිත උන්වහන්සේගේ පින්පොත මෙම කාලසීමාවට අයත් පුණ්‍ය පුස්තකයකි. ශාසන ඉතිහාසයෙන් ආරම්භ වී තමන්වහන්සේගේ පැවිද්දේ සිට කරන ලද පින්කම් එහි දක්වා තිබේ (*හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පිං පොත*, 2012, පි. 33-40).

මහනුවර යුගයේ දැකගත හැකි තවත් විශේෂ සිරිතක් ලෙස දිනපොත් ලිවීම හඳුනාගත හැකිය. එය ද බොහෝ විට ආගමික පසුබිමක් යටතේ සිදුකෙරුණු අතර දිනපතා තමන් විසින් සිදු කරන ලද පින්කම් පිළිබඳ රචනා කොට තැබීම එහි අරමුණ වූ බව පෙනේ (ඉලංගසිංහ, 2005, 5). මෙනිසා මල්වතු විහාර පාර්ශ්වයේ මහානායක පදවිය දැරූ මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන්ගේ දිනපොත, පින් පොතක් වශයෙන් සැලකිය හැක්කේ උන්වහන්සේ විසින් සිදු කරන ලද පුණ්‍ය ක්‍රියා පිළිවෙළින් දින වකවානු ද සහිතව එහි දක්වා තිබීම හේතුවෙනි (*මොරතොට දිනපොත*, 2006, පි. 26-71).

කටපයාදී ක්‍රමයට අනුව වර්ෂය දක්වා ඇති මෙම දිනපොතේ උදාහරණයක් මෙසේ ය.

> ...ශකාබ්දම් තොසතුල්‍යම්.... පැවිදි ලත් මොරතොට ධම්මක්ඛන්ධ භික්‍ෂු වන මම එතැන් පටන් මේ තිස් අවුරුද්ද අදනා නානකඩ පට අංශකඩ දීපුවා හැර කඨින තිහට රාත්‍රී බණ දෙකට පූජා කළ සිවුරු ඇතුළුව කසා පිළි සිවුරු දොළසකි. පට සිවුරු තුදුසකුත් සමග මුල් සිවුරු පන් සියයක් පූජා කලාය. සමන් මල් මිලදී ගෙන සසාලිස් ලක්‍ෂයක් පූජා කලාය. ශතපෙන ගෙයි මණ්ඩපයේදී කී බණ හා මංගල මන්දිරයේදීත් රාත්‍රී බණ එකොලහක් ඇතුලුව රාත්‍රී බණ තෙසැටහක් කීවාය....(*මොරතොට දිනපොත*, 2006, පි. 27).

**පුණ්‍යානුමෝදනා සන්දේශ**

පුණ්‍යානුමෝදනා සන්දේශ වශයෙන් හැඳින්වෙන්නේ තමන් විසින් සිදු කරන ලද පින්කම් තවකෙකුට අනුමෝදන් කිරීමේ අරමුණින්ම රචනා කරන පුණ්‍ය ලේඛන විශේෂයයි. බොහෝ විට රජතුමාට හෝ රදල ප්‍රධානියකුට තමන් විසින් සිදු කරන ලද පින්කම් අනුමෝදන් කිරීම මෙහි අරමුණයි. මෙය පුණ්‍යානුමෝදනා පත්‍රවලින් වෙනස්වන්නේ පුණ්‍යානුමෝදනා පත්‍ර සංක්ෂිප්ත වීමත්, පුණ්‍යානුමෝදනා පත්‍රවලින් විටෙක තමාට ද පින් අනුමෝදන් කරගැනීමත් හේතුවෙනි. පුණ්‍යානුමෝදනා පත්‍රවල සේම පුණ්‍යානුමෝදනා සන්දේශවල ද අරමුණු එක හා සමාන බව පෙනේ. ඒ හැරුණු විට අන්‍යයන් පින්කම් සඳහා පෙළඹවීමට ද පුණ්‍යානුමෝදනා සන්දේශ උපකාරී කරගෙන තිබේ. මෙය සන්දේශයක් වන හෙයින් එය බහාලීමට විශේෂිත ඇසුරුමක් භාවිත කර තිබෙන බවට සාධක හමු වේ.

මෙම කාලවකවානුවට අදාළව පුණ්‍යානුමෝදනා සන්දේශ රාශියක් හමුවී තිබෙන අතර අස්ගිරි විහාර පාර්ශ්වයේ මහානායක පදවිය හෙබවූ උරුලෑවත්තේ ධම්මසිද්ධි මහනාහිමියන් විසින් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාට පින් අනුමෝදන් කරමින් රචිත බම්බා විහාර පුණ්‍යානුමෝදනා සන්දේශය, පහතරට සංඝනායක පදවිය දැරූ දෙමටපිටියේ සංඝරක්ඛිත නාහිමියන් විසින් කන්ද උඩරට උපරජතුමාට පින් අනුමෝදන් කරන ලද පුණ්‍යානුමෝදනා සන්දේශය, වැලිගම අග්‍රබෝධි විහාරය ඇතුළු විහාර ගණයේ පවත්වන ලද පින්කම්වල පින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට අනුමෝදන් කළ පුණ්‍යානුමෝදනා සන්දේශය ඉන් කීපයකි ( ; වීරසූරිය, 2008, පි. 61-64; වනරතන හිමි, 2008, පි. 273-276 *; බම්බා විහාර පුණ්‍යපත්‍ර සන්දේශය*, 2015). විටෙක මෙම පුණ්‍යානුමෝදනා සන්දේශයට පිළිතුරු වශයෙන් පින් අනුමෝදන් වූ තැනැත්තා විසින් ද පිළිතුරු සන්දේශ එවූ බවට සාධක හමු වේ. ඊට නිදසුනක් වන්නේ සියමේ ධාර්මික රජතුමා සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා අතර හුවමාරු වූ පුණ්‍යානුමෝදනා සන්දේශ දෙකයි ( ධම්මානන්ද හිමි, 1969, පි. 221-261 ; වනරතන හිමි, 2008, පි. 276-288).

**පුණ්‍ය අයැදුම් පත්‍ර**

පින් අනුමෝදන් කරවීමට කටයුතු කරන ලෙස ඉල්ලා පුණ්‍ය අයැදුම් පත්‍ර යැවූ බවට ද සාධක හඳුනාගත හැකිය. ලෞකික හෝ ලෝකෝත්තර අරමුණු වෙනුවෙන් පින් අවශ්‍ය වන හෙයින් එලෙස පින් ඉල්ලා සිටින්නට ඇත. උදාහරණයක් වශයෙන් වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් විසින් වටරග්ගොඩ ධම්මපාල නාහිමියන් වෙත එවන ලද ලිපියක මුල් කොටසේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ලබාදිය යුතු අවවාද පිළිබඳ දක්වා ඇති අතර අවසානයට දක්වා ඇත්තේ,

> ...ප්‍රතිපත්ති ශාසන බබුළුවා ශිෂ්‍ය සුණූන්ට ආචාර්‍ය පිතෘවූ මටත් සකල ශාසන ප්‍රතිෂ්ඨාවට ආධාර වූ අපගේ දෙවිමහරාජොත්තමයාණන් වහන්සේටත් පින්දුන මැනවි....
>
> යනුවෙනි (ධම්මානන්ද හිමි, 1969, පි. 150).

එසේම මල්වතු විහාර පාර්ශ්වයේ මහානායක පදවිය දැරූ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහනාහිමියන් විසින් වටරග්ගොඩ ධම්මපාල නාහිමියන් වෙත එවන ලද තවත් ලේඛනයක දැක්වෙන පහත සටහන වැදගත් එකකි,

> ...මේ අවුරුද්දේ දුරුතු මාසයේදී මහතෙරුන් වහන්සේලා වඩින්ට යෙදී තිබෙන නිසා ඒ ගමනෙම ලියාගෙන ගොස් සියාම් දේසේ මහරජ්ජුරුවන්ට ඔප්පු කරමින් පින් දක්වන ශැටියට ලඞ්කාවේ සියළු උපසම්පදා සාමණේර තැන්වල වග විභාග ඇතිව ලියා ගෙන යන්ට ඕනෑ.....(*මූලගිරි මහා විහාර වංශය*, 2002, පි. 285)

සියම් උපසම්පදාව මෙරට පිහිටුවීම සඳහා දායකත්වය දැක්වූ සියමේ මහරජතුමාට ඒ වෙනුවෙන් පින් අනුමෝදන් කරවීමට සූදානම් වීම මෙහි අරමුණ වූ බව පෙනෙන්නට තිබේ. මුල්වරට වැඩම කරවනු ලැබූ සියම් මහතෙරුන් වහන්සේලා නැවත මව්රටට වැඩම කරවන විට ඒ සමග සියම් මහරජතුමාට පුණ්‍යානුමෝදනා සන්දේශයක් පිටත් කිරීම මල්වතු මහනාහිමියන්ගේ අභිප්‍රාය වූ බව පෙනේ. ඒ යටතේ සියම් උපසම්පදාවට ඇතුළත් වූ සියලු සාමණේරවරුන් පිළිබඳ තොරතුරු සහ සියම් භික්ෂූන් විසින් මෙරට සිදු කරන ලද ශාසනික මෙහෙවර පුණ්‍යානුමෝදනා සන්දේශයකට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් වන්නට ඇතැයි සිතිය හැකිය. දෙවැනි වරට ද සියම් භික්ෂූන් කණ්ඩායමක් මෙරටට වැඩම කරවාගැනීමට අවශ්‍යව තිබූ හෙයින් ඒ සඳහා සියම් මහරජතුමාගේ සහය ලබාගැනීමට ද මෙකී පුණ්‍යානුමෝදනාව සහයවන්නට ඇත.

**සමාලෝචනය**

රජතුමාගේ පටන් සාමාන්‍ය ජනතාව දක්වා තමන් විසින් සිදු කරන ලද පින්කම් සටහන් කොට තැබීමට 'පුණ්‍ය ලේඛන' නමින් හැඳින්වෙන ලේඛන සම්පාදනය කළ බව හඳුනාගත හැකිය. බහුලවම පුස්කොළ මාධ්‍ය කොටගෙන රචිත පුණ්‍ය ලේඛන බොහෝ විට පුස්කොළ පොතකට ඇමුණුමක් ලෙස හෝ පුස්කොළ පොතක් වශයෙන් හෝ සකස් කොට විහාරස්ථානයක තැන්පත් කර තැබීමේ සිරිතක් වූ බව දැකිය හැකිය. පුණ්‍ය ලේඛනවල පවතින ස්වභාවය අනුව ඒවා පුණ්‍යානුමෝදනා පත්‍ර, පුණ්‍ය පුස්තක, පුණ්‍යානුමෝදනා සන්දේශ සහ පුණ්‍ය අයැදුම් පත්‍ර යනුවෙන් වර්ගීකරණය කිරීමේ හැකියාව පවතී. වංසකථාකරණයට තොරතුරු ලබාගත් මූලාශ්‍රයක් වූ පුණ්‍ය ලේඛන මහනුවර යුගය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා භාවිත කළ හැකි මෙතෙක් අවධානය යොමු නොවූ මූලාශ්‍රය විශේෂයක් වශයෙන් හඳුනාගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

*අස්ගිරි තල්පත* (1997). රෝහණධීර, එම්. (සංස්.). කර්තෘ ප්‍රකාශන.

ඉලංගසිංහ, මංගල (2005). *මධ්‍යකාලීන ලංකාවේ ආගම*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*ඌනපූරණ සහිතො මහාවංසො* (2006). බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.). ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*කෝසල බිම්බ වර්ණනාව* (2015), බණ්ඩාර, ආර්.ඩබ්.පී. හා ගුණසිංහ, එච්.සී. (සංස්.) කර්තෘ ප්‍රකාශන.

ගමගේ. එන්. (1980). *කරතොට නාහිමි*. සී/ස මාතර වෙළෙන්දෝ.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (1967). *සපරගමු දර්ශන*. ශාස්ත්‍රෝදය යන්ත්‍රාලය.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1966). *ඌව ඉතිහාසය*. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1969). *මධ්‍යම ලංකා පුරාවෘත්ත*. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*පාඨශාලීය සද්ධර්ම කෝෂය* (2002). සෝමානන්ද හිමි, තෙරිපැහැ ඇතුලු තවත් අය (සංස්.). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*බම්බා විහාර පුණ්‍යපත්‍ර සන්දේශය* (2015). විමලතිස්ස හිමි, වේදිනිගම හා බණ්ඩාර, ආර්.ඩබ්. ප්‍රියදර්ශන (සංස්.). වැල්ලව පන්සල. අස්ගිරි මහාවිහාරය.

*බෞද්ධ ශබ්දකෝෂය* II (2010), ලියනගේ, සිරි (සම්.), කර්තෘ ප්‍රකාශන.

*මූලගිරි මහා විහාර වංශය* (2002). සුමනජෝති හිමි, පල්ලත්තර ශ්‍රී (සංස්.). මූලගිරි සංඝ සභාව.

*මොරතොට දිනපොත* (2006). යටවර, එම්.ඩී.එම්.එස්. (සංස්.). සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

*රාජරත්නාකරය* (1995). රූපසිංහ, කේ. (සංස්.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වනරතන හිමි, කඹුරුපිටියේ (2008). *රුහුණේ පැරණි අත් ලිපි*. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

*වංසත්ථප්පකාසිනී* (2001). අමරවංස හිමි, අකුරටියේ සහ දිසානායක, එච්. (අනු.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වීරසූරිය, පී.ඩී.ඇස්. (2006). *ලේඛන පුරාණය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වීරසූරිය, පී.ඩී.ඇස්. (2008). *මාතර සාහිත්‍ය වංශය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*ශ්‍රී සුමංගල ශබ්දකෝෂය* - ද්විතීය භාගය (2011). සෝරත හිමි, වැලිවිටියේ (සම්.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*සිංහල විමාන වස්තු ප්‍රකරණය* (2003). ධම්මානන්ද හිමි, මාකෙහෙල්වල (සංස්.). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
*සිංහල උපාසක ජනාලංකාරය* (1961), සමරනායක, ඩී.පී.ආර්. (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම,

සෙනෙවිරත්න, ඒ. (2003). 'ඇහැලේපොළ පූජා කළ දළදා කරඬුව'. *ලක්දිව බුදුසසුන හා සිංහල සංස්කෘතිය.* ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

*හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පිං පොත* (2012). බණ්ඩාර, ආර්.ඩබ්.පී. (සංස්.). අම්බරේගොඩ ශ්‍රී බෝධිරාජාරාම ප්‍රකාශන.